නිපුණතාවය :- 03. ව්‍යාපාර සංවිධාන වර්ග සහ ඒවා පිළිබඳ මූලික තොරතුරු විමසමින් තමාට සුදුසු ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමට අවශ්‍ය පසුබිම සකසා ගනියි .

නිපුණතා මට්ටම :- 3.2. යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ මූලික හැකියාව ලබයි .

(කේවල ස්වාමි ව්‍යාපාර) ඔබගේ පෙළ පොතේ පිටු අංක 28 සිට 30 දක්වා හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න .

කෙටි සහ නිශ්චිත පිළිතුරු සපයන්න .

01. තනි පුද්ගල ව්‍යාපාරයක් යන්න හඳුන්වන්න .

02. තනි පුද්ගල ව්‍යාපාර හඳුන්වනු ලබන වෙනත් නම් දෙකක් ලියන්න .

03. ලෝකයේ බහුලවම තනි පුද්ගල ව්‍යාපාර දක්නට ලැබෙන්නේ ඇයි ?

04. තනි පුද්ගල ව්‍යාපාර වල සාර්ථක බව රැඳී පවතින්නේ කුමන කරුණු මතද ?

05. තනි පුද්ගල ව්‍යාපාරයක දක්නට ලැබෙන ලක්ෂණ හතරක් නම් කරන්න .

06. තනි පුද්ගල ව්‍යාපාරයකට අවශ්‍ය ප්‍රාග්ධනය සම්පාදනය කර ගත හැකි මාර්ග දෙකක් නම් කරන්න .

07.තනි පුද්ගල ව්‍යාපාරයක " අසීමිත වගකීම " යන සංකල්පයෙන් අදහස් කරන්නේ කුමක්ද

08.තනි පුද්ගල ව්‍යාපාරිකයාට තම ව්‍යාපාරයේ නමින් කල නොහැකි කාර්යයන් දෙකක් නම් කරන්න .

09. තනි පුද්ගල ව්‍යාපාරයක් අවසන් විය හැකි ආකාර තුනක් නම් කරන්න .

10. තනි පුද්ගල ව්‍යාපාරයක් ලියා පදිංචි කළ යුත්තේ කුමන අවස්ථාවක දී ද ?

අභ්‍යාස .

** තනි පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ හැකි වාසි සහ අවාසි පහ බැගින් දක්වමින් වගුවක් පිළියෙල කරන්න .